සූර්යකන්ද ඛේදවාචකය



06 කොටස

සූරිය කන්ද සිසු ඝාතනය අපේ රටේ සිදුවූ අති බිහිසුණු කෲර ඛේදවාචකයකි. මේ එම ඝාතනය පිළිබඳ රහස් පොලිසිය කළ අපක්ෂපාතී පරීක්ෂණයේදී ඊට මුල් වූ කරුණු ඇසුරින් සකස්වූ ලිපියකි.



# චූදිතයන් අත්අඩංගුවට නොගන්නා හේතුව

## හිටපු නියෝජ්‍ය පොලිස්පති ප්‍රේමදාස උඩුගම්පොළ මෙසේ පැහැදිලි කරයි

එහෙත් මෙම පාසල් දරුවන් තිස් දෙදෙනා පැහැරගෙන යෑම පිළිබඳව පවතින රජයට අවංකවම ක්‍රියා කළ හැකිද ඇත්ත වශයෙන්ම රජයට එසේ කළ නොහැකිය. ඊට හේතු පහත දක්වමි.

1.කොමිෂන් සභාවක් විසින් කරන පරීක්ෂණයකදී මෙම අපරාධය ආණ්ඩු පක්ෂයේ දේශපාලනඥයන්ගේ අනුදැනුම ඇතිව කරන ලද බව සක්සුදක් සේ පැහැදිලි කරන සාක්ෂි වුවමනාවටත් වඩා ඉදිරිපත් වනු ඇත.

2. කළු බළලුන් සමඟ පාලක පක්ෂයේ දේශපාලනඥයන්ගේත් සන්නද්ධ හමුදාවලත් ඇති සම්බන්ධය ජනතාවට හෙළිදරව් වනවා ඇත.

3. ආණ්ඩු පක්ෂයේ දේශපාලනඥයන්ගේ නියෝග පරිදි කළු බළලුන් විසින් දේශපාලන විරුද්ධවාදීන් ක්‍රමානුකූලව විනාශ කිරීම සාක්ෂි සහිතව ඔප්පු වෙනවා ඇත.

4. ශිෂ්‍යයන් පැහැර ගෙන යාම පිටුපස තිබුණු අරමුණ තනිකරම දේශපාලන තරහ බව එයින් ඔප්පු වනු ඇත.

5. මේ සිද්ධියේ දී ඉදිරිපත් වන සාක්ෂිවලින් කළු බළලුන් විසින් එක්සත් ජාතික පක්ෂයේ දේශපාලන විරුද්ධවාදීන් ඝාතනය කරනු ලැබීම් තවත් බොහෝ ගණනක් හෙළිදරව් වෙනවා ඇත.

රජයේ නියෝජිතයා මෙසේ කියයි

නඩු දාන්න සාක්කි තිබෙනවා. ඒත් තවම පියවරක් නැහැ

රජය විසින් පත්කරන ලද මානව හිමිකම් බළකායේ

සභාපති ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු J.F.A. සෝසා

දරුවන් පැහැරගෙන යාම මවුපියන් දුටු අතර මෙම දරුවන් සමඟ අත්අඩංගුවට ගෙන පසුව මුදාහළ දෙදෙනකුද මෙම දරුවන් සෙවණ හමුදා කඳවුරේ සිටිනු දැක ඇත. දරුවන් පැහැරගෙන ගිය අය හඳුනාගත් මෙම ඇසින් දුටු සාක්කි මගේ මතය අනුව වගකිවයුත්තන්ට විරුද්ධව නඩු පැවරීමට ප්‍රමාණවත් තරම් ප්‍රබලය.

දරුවන් සම්බන්ධයෙන් ප්‍රකාශය සටහන් කර ගත් පොලිසිය එය නීතිපතිවරයා වෙත යවා තිබේ. එතුමා එය සලකා බලන බව කියමින් සිටී.

තමන් සිසුන් අත්අඩංගුවට නොගත් බව වගඋත්තරකරුවන් ප්‍රකාශ කළ විට මාපියන් ඉදිරිපත් කොට ඇති හබයාස්කෝපුස් පෙත්සම් නිෂ්ඵල වනු ඇත. හබයාස්කෝපුස් පෙත්සම් රජය වගකීමෙන් නිදහස් නොකරයි.

### එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ වාර්තාව

වගකිවයුත්තන්ට විරුද්ධව පියවර ගැනීමට බලධාරීන් අපොහොසත්

ඇඹිලිපිටියේ සිසුන් තිස් දෙදෙනා අතුරුදන් කරවීමට සම්බන්ධ වූ විදුහල්පතිවරයා හමුදා පිරිස ඉතා පැහැදිලිවම හඳුනාගෙන තිබියදී ඔවුන්ට විරුද්ධව නඩු පැවරීමටවත් ඔවුන් අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීමට හෝ සැකකරුවන් හැටියට ඉදිරිපත් කරවීමටවත් ශ්‍රී ලංකා රජයේ බලධාරීන් අපොහොසත් වී ඇති බව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම ප්‍රකාශ කරයි.

මේ සිසුන් තිස් දෙදෙනාම ජේවීපී ආධාරකරුවන් හා වෙනත් නීති විරෝධී කටයුතු කිසිවකුට හෝ කිසිසේත්ම සම්බන්ධ නැති බව රජය ද පිළිගනී.

මෙලෙස ඉතා වැදගත් වූ මේ සිද්ධියේ මෙන්ම ජනමාධ්‍යවේදී රිචඩ් ද සොයිසා ඝාතනය වැනි පරීක්ෂණ දිගටම නොකිරීම ගැන එක්සත් ජාතීන්ගේ කොමිසම සිය අසතුට හා අප්‍රසාදය පළ කරන අතර කොමිසමට මේ අනුව නිගමනය කළ හැකි වන්නේ රාජ බලධාරී අතුරුදන් කිරීම් පිටුපස සිටින නිලධාරීන් රකිනා ගමන්ම එවැනි ක්‍රියා දිගටම සිදුවීම අනුමත කරන බව යැයි කොමිසම සිය වාර්තාවෙන් පෙන්වා දෙයි. ශ්‍රී ලංකා රජය කොමිසමට පවසා සිටියේ සැලසුම් ක්‍රියා පිළිවෙතට අනුව විදුහල්පතිවරයා අත්අඩංගුවට නොගත්තේ යුද හමුදා නිලධාරියාගෙන් පළමුව ප්‍රශ්න කළ යුතු යැයි යන නියාවෙනි. එසේ වුවද නිලධාරියාගෙන් ප්‍රශ්න කිරීමක් හෝ ඔහු අත්අඩංගුවට ගැනීම හෝ නොකර සිද්ධියට අදාළ නිලධාරීන් හතර දෙනා සමග උතුරේ මෙහෙයුම්වලට ඔහු යවා ඇත. අනිත් දෙදෙනා කොහෙද යන්න නොදනිති යැයි කොමිසම කියයි. මෙම විදුහල්පතිවරයා පළමුවෙන් තාවකාලිකව අල්ලස් ගත්තා යැයි චෝදනා මත

නිගමනය කළ හැකි වන්නේ රාජ බලධාරී අතුරුදන් කිරීම් පිටුපස සිටින නිලධාරීන් රකිනා ගමන්ම එවැනි ක්‍රියා දිගටම සිදුවීම අනුමත කරන බව යැයි කොමිසම සිය වාර්තාවෙන් පෙන්වා දෙයි. ශ්‍රී ලංකා රජය කොමිසමට පවසා සිටියේ සැලසුම් ක්‍රියා පිළිවෙතට අනුව විදුහල්පතිවරයා අත්අඩංගුවට නොගත්තේ යුද හමුදා නිලධාරියාගෙන් පළමුව ප්‍රශ්න කළ යුතු යැයි යන නියාවෙනි.

තනතුරෙන් ඉවත් කළ ද දැන් නැවතත් ඔහු සේවය පිහිටුවා ඇති අතර හේ දැනට උසස් වීමක් ලැබීමට ආසන්නව සිටීමේ සිද්ධිය ගැන වැඩිදුර පරීක්ෂණ පිහිටි මෙම කොමිසමේ සාමාජිකයන්ට අවබෝධ වූයේ මෙම පැහැරගෙන ගොස් කළ අතුරුදන් කිරීම් පෞද්ගලික අරමුණක් උදෙසා ඉටුකර ඇති බව වන අතර මේ සිසුන් තිස් දෙදෙනා රාජ විරෝධී කටයුතුවලට හෝ නීති විරෝධී කිසිම දෙයකට හවුල් වී හෝ ආධාර අනුබලදී නැති බව යැයි එම වාර්තාව පෙන්වා දෙයි.

පළාතේ බලවතුන් ජවිපෙ ආධාරකරුවන් ඇති කරවීම උදෙසා මේ සිසුන් ජනතා විමුක්ති පෙරමුණේ අයට ඔත්තු සපයන්නන් හැටියට හඳුන්වා දී ඔවුන්ව අතුරුදන් කරවීමට කටයුතු යෙදී යැයි කොමිසම පවසයි.

1991 දී මෙම කොමිසම නිර්දේශ කළ පියවර කිසිවක් අනුගමනය නොකර තවදුරටත් කටයුතු කර ඇති බලධාරීන් ආධාරකරුවන්ට විරුද්ධව නඩු පැවරීමක් හෝ නීතිමය පියවරක් හෝ ගෙන නැති අතර මේ තත්ත්වය කිසිම යහපත් වර්ධනයක් හෝ දියුණුවක් වී නැතැයි කොමිසම සටහන් කරයි.

යම් යම් කරුණු යනුවෙන් සුදුසු යැයි සලකා පැය විසිහතරක් ගතවීමටත් මත්තෙන් චෝදනා භාරදී නඩු පැවරිය හැකි ශ්‍රී ලංකා නීතිපතිවරයාගේ කාර්යාලයට ඇඹිලිපිටියේ සිසුන් තිස් දෙදෙනා අතුරුදන් කරවීම ඇතුළු භයානක අතුරුදන් වීම් සහිත වැදගත් සිදුවීම්වලට අදාළ අයට විරුද්ධව පියවර ගැනීමට හැකි විය යුතුය යන්න කොමිසම අදහස් කරයි.

මේ ළමයි තිස් දෙදෙනාගේ මරණ ගැන වග කිවයුත්තෝ කවරහුද යන්න ශ්‍රී ලංකා මානව හිමිකම් කාර්ය බළකාය හඳුනාගෙන තිබියදීත් කිසිම නීතිමය පියවරක් ගෙන නැති වීම කොමිසමේ අවධානයට ලක් වීමෙන්ම ජනමාධ්‍යවේදී රිචඩ් ද සොයිසා ඝාතනයට අදාළ පරීක්ෂණද කිසිම යහපත් වර්ධනයක් නොපෙන්වන බව ද වැඩිදුරටත් පෙන්වා දෙනු ලබයි.

ඇඹිලිපිටිය සිද්ධිය අතුරුදන් වූවන්ගේ ඇටසැකිලි ආධාර කර ගෙන ඔවුන් හඳුනා ගැනීමට හැකිවන ලෙස පරීක්ෂණ පැවැත්වීමට එක්සත් ජාතීන්ගේ සහයෝග යෙන් අන්තර්ජාතික ව්‍යවහාරික විද්‍යාඥයන් වුවද ශ්‍රී ලංකා රජයට සපයා දීමට ඉඩ කඩ ඇතැයි ද කොමිසම නිරීක්ෂණය කරන බව වාර්තාවෙන් ප්‍රකාශ කර ඇත.



**(භීෂණ සමයේ ශ්‍රී ලංකාවේ සිටි ඇමෙරිකන් පුවත්පත් කලාවේදියකු වන ස්ටීවන් කෝල්ගේ සටහනකින් උපුටා ගන්නා ලදී)**

**ලබන සතියට**

සැකසුම:රවිප්‍රසාද් හේරත්